පුරාවේද

පුරාවිද්‍යා හා උරුම කළමණාකරන අධ්‍යනාංශය

සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

මිහින්තලේ

9 වන කලාපය 1 හා 2 වෙළුම

# පුරාවේද සඟරාව සඳහා පර්යේෂණාත්මක ලිපි භාර ගැනීම

## ලිපි ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මූලික මාර්ගෝපදේශ

| | |
|---|---|
| **භාෂාව** | සිංහල/English |
| **අකුරු මාදිලිය** | සිංහල - FMAbhaya ඉංග්‍රීසි - Times New Roman |
| **අකුරු ප්‍රමාණය** | ප්‍රධාන මාතෘකා- 16/Bold අනු මාතෘකා - 14/Bold අන්තර්ගතය - 12 |
| **ප්‍රමාණය** | වචන 5000ක උපරිමයකට යටත්ව සියලු අන්තර්ගතයන් සම්පිණ්ඩනය කළ යුතු වේ. |

## පර්යේෂණ පත්‍රිකාව පහත පරිදි සංක්ෂිප්තයකින් හා ලිපි අන්තර්ගතයකින් යුතු විය යුතු වේ

| | |
|---|---|
| **සංක්ෂිප්තය** | මාතෘකාව, කර්තෘ විස්තරය (නම, උපාධි පාඨමාලාව, අධ්‍යයන වර්ෂය, දෙපාර්තමේන්තුව, ලිපිනය) සංක්ෂිප්තය, මුඛ්‍ය පද. |
| **ලිපි අන්තර්ගතය** | හැඳින්වීම, ක්‍රමවේදය, ප්‍රතිඵල හා සාකච්ඡාව, සමාලෝචනය හා/හෝ නිගමනය, උපකාරානුස්මෘතිය, මූලාශ්‍රය |

## අන්තර්ගතය පිළිබඳ පැහැදිලි කිරීම

| | |
|---|---|
| මාතෘකාව | පර්යේෂණයට අදාළ, අනන්‍ය හා සංක්ෂිප්ත මාතෘකාවක් විය යුතුය. |
| කර්තෘ විස්තර | කතුවරයාගේ නම හා ලිපිනය ඇතුළත් කිරීම අවශ්‍ය වේ. උපාධි අපේක්ෂක ලෙස ඉදිරිපත් කරන්නේ නම් අදාළ අධ්‍යයන වර්ෂය (පළමු, දෙවැනි, තෙවැනි හෝ සිව්වැනි වසර ලෙස) ද, අධ්‍යයනාංශය, විශ්වවිද්‍යාලය හා විද්‍යුත් තැපැල දැක්වීම අනිවාර්යය වේ. කතුවරු කීපදෙනෙකු වේ නම් ඔවුන් සියලුදෙනාගේ ද ඉහත විස්තර අවශ්‍ය වේ. |

| | |
|---|---|
| සංක්ෂිප්තය | පර්යේෂණය සම්බන්ධයෙන් කෙටි හැඳින්වීමක්, අරමුණ, පරමාර්ථ, ක්‍රමවේදය, ප්‍රමුඛ අනාවරණයන්, පර්යේෂණයේ වැදගත්කම මතුකරන ලද වචන **<u>250ක</u>** සීමාවෙන් යුතු සංක්ෂිප්තයක් ඇතුළත් විය යුතු වේ. |
| ප්‍රමුඛ පද | සමස්ත පර්යේෂණයේ නියෝජනයක් වන ලෙස ප්‍රමුඛ පද **<u>5ක්</u>** ලබා දිය යුතු වේ. |
| හැඳින්වීම | සංක්ෂිප්තව පර්යේෂණය වෙත ප්‍රවේශ වීම අපේක්ෂා කෙරේ. මෙහි දී පර්යේෂණ ගැටළුව හෝ අරමුණ, වැදගත්කම හා උපන්‍යාසය පැහැදිලි කළ යුතුය. සාහිත්‍ය විමර්ශනයක් තුළින් පර්යේෂණ හිදැස මතුකොට දක්වන බැවින් එහි දී මූලාශ්‍ර මගින් තොරතුරු තහවුරු කිරීම අපේක්ෂා කෙරේ. නිශ්චිත භූගෝලීය පිහිටීමක් ඉලක්ක කර ගනිමින් සිදු කරන පර්යේෂණයක් නම් විශ්වීය ස්ථානගත වීම හා මාර්ග පහසුකම් ආදිය දැක්වීම ද අපේක්ෂා කෙරේ. මෙම කොටස විෂයානුබද්ධ නොවන අයෙකුට වුවත් පර්යේෂණය පිළිබඳ පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිදි සකස් කළ හැකි නම් මැනවි. |
| ක්‍රමවේදය | පර්යේෂණ ක්‍රමවේදය පැහැදිලිව දක්වා තිබීම අවශ්‍ය වේ. දත්ත අත්පත්කර ගැනීම හා දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලද ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රම මැනවින් විස්තර කර තිබීම අවශ්‍ය ය. |
| ප්‍රතිඵල | පර්යේෂකයා විසින් සිදු කරන පර්යේෂණයේ දී හඳුනා ගන්නා ලද ප්‍රමුඛ අනාවරණයන් ප්‍රතිඵල ලෙස හඳුනා ගනු ලැබේ. ඒවා ගැලපෙන පෙළගැස්මක් තුළ සංක්ෂිප්තව හා නිවැරදිව දැක්වීම සිදු කරන්නේ මෙහි දී ය. |
| සාකච්ඡාව | ඉහත පරිදි අනාවරණය කර ගත් පර්යේෂණයේ ප්‍රතිඵල පෙර හඳුනා ගන්නා ලද පරමාර්ථ ඔස්සේ නිශ්චිත අරමුණු කරා රැගෙන යන්නේ සාකච්ඡාවේදීය. එහි දී මුලින් ඇතිකර ගන්නා ලද උපන්‍යාස සාධනය හෝ නිෂේධනය කිරීම කෙරෙහි කටයුතු කෙරෙන අතර, නව අර්ථකථනවලට එළැඹෙන තෙක් මෙම සාකච්ඡාව කළ යුතුය. |
| සමාලෝචනය හා/හෝ නිගමනය | සමස්ත පර්යේෂණයේ ප්‍රමුඛ අනාවරණයන් මතු කරමින් සමාලෝචනය පිළියෙල කිරීම වඩාත් සුදුසු වේ. නමුත් මෙහි දී සැළකිලිමත් විය යුතු ප්‍රධාන කාරණයක් නම් ඉහත සාකච්ඡාවේ දී සඳහන් දෑ පමණක් සමාලෝචනය කළ හැකි වීමයි. ඇතැම් පර්යේෂණ පත්‍රිකා අවසානයේ නිගමනයක් ඇති අතර, එසේ නොමැති අවස්ථා ද තිබේ. |

| | |
|---|---|
| උපකාරානුස්මෘතිය | පර්යේෂණය සඳහා කවර ආකාරයේ හෝ සහයෝගය ලබා දුන් අය වේ නම් හා ඔවුනට ගෞරවයක් ලෙස ඔවුනගේ නාමය සඳහන් කිරීම යෝග්‍ය යයි කතුවරයා සිතන්නේ නම් උපකාරානුස්මෘතියෙහි ඔවුන් ඇ‍ගැයිය හැකි ය. |

**<u>තාක්‍ෂණික උපදෙස්</u>**

| | |
|---|---|
| මූලාශ්‍ර | හාවර්ඩ් උද්ධරණ ක්‍රමය (Harvard Style) භාවිතා කළ යුතු වන අතර ශාස්ත්‍රීය ලේඛන දැක්වීමේ දී පමණක් නොව වගු, සැලසුම්, ඡායාරූප ආදිය දැක්වීමේ දී ද ආශ්‍රිත මූලාශ්‍රය (උපුටා ගැන්ම) දැක්වීම අවශ්‍ය වේ. |
| වගු සැලසුම් හා ඡායාරූප | පර්යේෂණයට යොදා ගන්නා වගු, සැලසුම් හා ඡායාරූප ආදාළ අංකය යටතේ නාමකරණය කර වෙනම ඇමුණුම් ලෙස අදාළ විද්‍යුත් ලිපියෙහිම ඇතුළත් කිරීම අවශ්‍ය වේ (මුද්‍රණයේ දී ගුණාත්මක ප්‍රතිඵලයක් සඳහා එය ඉවහල් වනු ඇත). සියලුම ඇමුණ TIFF, JPEG ආකෘතියට අනුකූල විය යුතුය. ඇමුණුම් ලිපියේ අවසාන අදාළ ස්ථානයේ දැක්විය යුතු අතර පිළිවෙළින් ඒවා අංක කළ යුතුය (ඡායාරූප අංක 01, වගු අංක 01, සැලසුම් අංක 01). ඇමුණුම් ශීර්ෂ සහිත විය යුතු අතර වගු සඳහා මාතෘකා මෙන්ම එහි අක්ෂර ප්‍රමාණය 8pt ට නොඅඩු විය යුතුය. MS word මගින් වගු නිර්මාණය කළ යුතු අතර වර්ණ ඡායාරූප ද ඇතුළත් කළ හැකිය. |
| **පර්යේෂණ ලිපි ලබා දීම** | දක්වා ඇති උපදෙස් අනුව සකසන ලද පර්යේෂණ ලිපියේ මෘදු පිටපත PDF හා Word යන මාධ්‍ය ද්වත්වයෙන් ම **2025.04.27** වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන විද්‍යුත් ලිපිනයට ලැබීමට සලස්වන්න. |
| **සැලකිය යුතුය** | ඔබ විසින් පිළියෙල කරන පර්යේෂණ ලිපි අපවෙත යොමු කිරීමට ප්‍රථම ඔබගේ අධ්‍යනාංශයේ අධ්‍යයන උපදේශකවරයෙකු විසින් පරීක්ෂා කර ප්‍රකාශනය සඳහා සුදුසු බවට අත්සනින් යුතු නිර්දේශයක් අප වෙත යොමු කරන්නේ නම් එය ලිපියේ සංස්කරණ හා සමාලෝචන කටයුතුවල දී පහසුවක් වනු ඇති අතර, එය ලිපිය ප්‍රකාශනය සඳහා අනුමැතිය හිමි වීමට ද ධනාත්මකව බලපානු ඇත. තව ද, සාමූහික අධ්‍යයනයක දී අධ්‍යයන උපදේශකවරයෙකු සම කතෘත්වය දරන ලිපියක් වුව ද ප්‍රකාශනය පිණිස යොමු කිරීමට පුරාවේද සඟරාවෙහි අවස්ථාව ලබා දී තිබේ. |

**පර්යේෂණ පත්‍රිකා යොමු කළ යුතු විද්‍යුත් ලිපිනය - <u>puraveda@ssh.rjt.ac.lk</u>**